බදුල්ල අධ්‍යාපන කලාපය

# සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය. 2018

8 ශ්‍රේණිය

## අත් අකුරු හා භාෂාවේ ශිල්පීය ක්‍රම

නම :-......................................................................................................... කාලය :- පැය 02 යි.

පාසල :-............................................................................ පාසල් වර්ගය :- 200 තෙක් / 201-500 තෙක් /500 ට වැඩි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01). පහත සඳහන් පාඨය රූල මත නිවැරදිව සම්මත හැඩයෙන් ලියන්න.

**සාහිත්‍ය සඳහා නොබෙල් ත්‍යාගය දිනාගත් ප්‍රථම ආසියාතිකයා වන්නේ රබීන්ද්‍රනාත් තාගෝර් ය.**

(ලකුණු = 10)

(02). පහත නම් කරන අක්ෂර පැහැදිලි ව නිවැරදිව ලොකු අකුරින් ලියන්න

1. මූර්ධජ **ස** - ........................................
11. මූර්ධජ **න** - ........................................
111. මහප්‍රාණ **ග** - ........................................
1v. සඤ්ඤක **බ** - ........................................
v. තාලුජ **ස** - ........................................ (ලකුණු 2×5= 10)

(03). පහත සඳහන් ජේදයේ අක්ෂර වින්‍යාසය සදොස් තැන් නිදොස් කොට නැවත ලියන්න.

සංචාරකයෝ අදිරාජයාගේ ප්‍රෞඩ මාලිගයෙන් මලින් පිරි උද්‍යානයත් නරඹා ඒවායේ සුන්දරත්වය අගය කලහ. අන් සියල්ලටම වඩා එය අතිෂයින් මිහිරි බව ඔවුහු ප්‍රත්‍යක්ශයෙන් දත්හ. මෙහි පුංචි කිරිල්ලියක වසන බැව් දැනගත් අදිරාජයා බෙහෙවින් විශ්මයට පත් ව රාජ සබාව කැදවීය.

(ලකුණු = 10)

(04). පහත සඳහන් ජේදයේ අදාළ ස්ථානවල නිවැරදි විරාම ලකුණු යොදා නැවැත ලියන්න.

අද එෆ් එම් තරංග ඔස්සේ විකාශනය වන ගුවන්විදුලි වැඩසටහන් බොහෝය මේවා බොහෝමයකින් ඇසෙන බොල් නිසරු සංගීත රාවයන්ගෙන් අසන්නාගේ රස වින්දනයට හානිවන නිසාත් එය ගුවන්විදුලි නිවේදකයන්ගේ භාෂාව මැරීමක් ද රටේ ජාතිකාභිමානයට එම ගුවන්විදුලි වැඩසටහන් හානිකර බවක් බොහෝ දෙනාගේ අදහසයි එනිසා අසන්නාගේ වින්දන ශක්තීන් ඉහළ මට්ටමකට ගෙන යා යුතුය

(ලකුණු = 05)

(05). පහත සඳහන් වැකිවල පද නිවැරදි ව බෙදා ලියන්න.

1. ගුවන් විදුලි වැඩ සටහන් අතරින් ප්‍රවෘත්ති සඳහා හිමිවන්නේ වැදගත් ස්ථානයකි.

11. රුහුණු පුරයේ මෙන්ම බුදු දහමෙද ආරක්ෂකයා වශයෙන් සැලකෙන්නේ කතරගම දෙවියන් ය.

111. රූපවාහිනිය ගුවන්විදුලිය පුවත් පත් අන්තර්ජාලය ජනමාධ්‍ය ලෙස හැඳින්වෙයි.

Iv. පරාස්ස නාට්‍යය රචනාකළේ රෝහණ දන්දෙණිය මහතායි.

v. පැරණි බණකතා රචනා කර ඇත්තේ අසා රසවිඳීම අරමුණු කර ගෙනය.

( ලකුණු = 05)

(06). අකුරුවල පිරිපුන් බව සම්මත හැඩය, අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ හා පද බෙදා ලිවීම යන කරුණු සලකා පහත සඳහන් කොටස දස (10) වාරයක් ලියන්න.

අතීතයේරෝහණරාජධානියේවලවේගංගාමිටියාවතේපිහිටිරිදියගමනගරයසහරම්බාවිහාරයආදිප්‍රදේසවලසිටඔරුපාරු ඔස්සේගෙනඑනදේශියනිෂ්පාදනරටපැටවුයේගොඩවායවරායෙනිඒක්‍රිස්තුපූර්වයුගයේසිටක්‍රිස්තුවර්ෂආරම්භකකාලයේදිය ක්‍රිවදෙවනසියවසේදිවරායෙන්ලැබෙනබදුමුදල්ඒආසන්නයේපිහිටිගොඩවායවිහාරස්තානයේදියුණුවසඳහායෙදවියයුතුබව ටගජබාහුරජුවිසින්පිහිටුවාඇතිසෙල්ලිපියමෙයටසාක්ශිසපයයි

( ලකුණු = 10)

(07). පහත අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියන්න.

1. මහප්‍රාණ අක්ෂරය බැගින් යෙදුන වචන පහක් ලියන්න.

11. පහත දි වචනයේ ඉරි ඇඳි අක්ෂරයේ ස්වර ව්‍යඤ්ජන වෙන් කර දක්වන්න.

| වචනය | ස්වරය | ව්‍යඤ්ජනය |
|---|---|---|
| ගෞරවය | .................... | ...................... |
| කුෘමියා | .................... | ...................... |
| ඓතිහාසික | .................... | ...................... |
| කෝප්පය | .................... | ...................... |
| ගීතය | .................... | ...................... |

111. ඥ අක්ෂරය යෙදුන වචන පහක් ලියන්න.

Iv. විසර්ගය හා අනුස්වාරය යෙදුන වචන දෙකක් ලියන්න.

v. පහත සඳහන් වචනවල යෙදි ඇති පිල්ලම් අනුපිළිවෙළින් ලියන්න.

- පුරාවෘත්ත -
- පූජෝපහාර

( ලකුණු = 50)